# පෙරවදන

පුද්ගලයකුගේ සමස්ත සංවර්ධනය රටක සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි ඍජු බලපෑමක් කරයි. දශක කිහිපයක සිටම ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස හැඳින්වේ. පුද්ගල සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රබල සාධකයක් ලෙස අධ්‍යාපනය දැක්විය හැකිය. අධ්‍යාපනය ලැබීම මූලික මිනිස් අයිතිවාසිකමක් ලෙස පිළිගන්නා මෙවන් අවධියක මිනිසාගේ සමස්ත පෞරුෂ සංවර්ධනය හා බැඳුණු මිනිසාගේ ආධ්‍යාත්මික දියුණුව පිළිබඳ ගැටලු ඇති බව පැහැදිලි කරුණකි.

විද්‍යා අධ්‍යාපනය ප්‍රචලිතව පැවතියද විද්‍යා අධ්‍යාපනයේ ඵලයක් ලෙස භෞතික දියුණුව යම් ප්‍රමාණයකට දිස් වුවද පුද්ගල සමස්ත සංවර්ධනයට හේතු වන ශික්ෂණය ලැබී ඇත්දැයි සැක සහිතය. විද්‍යා අධ්‍යාපනයෙන් ශිෂ්‍යයන් වෙත ස්ථාපිත විය යුතු ශික්ෂණය කෙබඳු දැයි හඳුනා ගැනීම කාලීන අවශ්‍යතාවයකි. විද්‍යා අධ්‍යාපනයෙන් ලැබිය යුතු ශික්ෂණය ශිෂ්‍යයන් වෙත ළඟා වන්නේ නම් පුද්ගල සංවර්ධනය මෙන්ම රටක සංවර්ධනය ද වේගවත් වේ.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන් මෙන්ම දෙමව්පියන් ශිෂ්‍යයන් ඇතුළු සමස්ත ප්‍රජාව විද්‍යා අධ්‍යාපනය කෙරේ දැඩි උනන්දුවක් දක්වනු පෙනේ. විද්‍යාව සම්බන්ධව ලියැවුණු සිංහල මාධ්‍යය පොත් බහුල වුවද එම පොත් වැඩි ප්‍රමාණයක් විභාග ඉලක්ක කරගෙන ලියවුණු විෂයය අන්තර්ගතය සහිත පොත් වීම පැහැදිලිව දැකිය හැකිය. විද්‍යා අධ්‍යාපනය පිළිබඳ සිංහල භාෂාවෙන් පොත් ලියවී ඇත්තේ අල්ප වශයෙනි.

මෙවැනි වාතාවරණයක් යටතේ විශ්ව විද්‍යාල , ගුරු විද්‍යාල හා පාසල් විද්‍යා අධ්‍යාපනය සම්බන්ධ ගුරුවරියක ලෙස ලබාගත්

අත්දැකීම් මත ලියන ලද, මෙම පොතින් විද්‍යා අධ්‍යාපනයේ සැඟවී ඇති හරය වන විද්‍යා අධ්‍යාපනයේ ශික්ෂණය පිළිබඳ දැක්වේ. නොයෙක් මට්ටමින් විද්‍යා අධ්‍යාපනය හා සම්බන්ධව කටයුතු කරන සැමට මෙම පොත ප්‍රයෝජනවත් වේ යයි සිතමි. විද්‍යාවේ ශික්ෂණය පිළිබඳ විද්‍යා ගුරුවරයා අවදි (සම්ප්‍රජානනය) නොවුවහොත් එම ශික්ෂණය ශිෂ්‍යයා වෙත ළඟාවීම බලාපොරොත්තු විය නොහැකිය.

විද්‍යා අධ්‍යාපනය පිළිබඳ සරලව හැදෑරීමට සිංහල භාෂාවෙන් ලියැවුණ පොත පතෙහි අඩුව සපිරීමට මෙම කෘතිය සම්පාදනය කිරීමට හැකිවීම සතුටට කරුණක් වන අතර එය ඔබ අතට පත් කරන්නට සහාය වූවෝ බොහෝය.

අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම කළ මහාචාර්ය ඩබ්. ජී. කරුණාරත්න මහතා කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. පිට කවරය හා පිටු සැකසුම කළ ග්‍රැෆික් අයි මුද්‍රණාලයේ කාර්යය මණ්ඩලයට ද, මුද්‍රණ කටයුතු කිරීමෙන් අනුග්‍රහය දක්වා මට ශක්තියක් වූ ජාතික විද්‍යා පදනම හා එහි ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිළධාරී කේ. ජී. ජනක කරුණාසේන මහතා ඇතුළු කළමනාකාරිත්වයට ද ප්‍රණාමය පුද කරමි.

අත් පිටපත සැකස්මට අත්වැලක් වූ නිමාලි අලහකෝන් මහත්මියට ද සෝදුපත් කියවූ කමලා තුඩුවගේ මහත්මිය ද සෙනෙහසින් සිහිපත් කරමි.

මෙම කාර්යයේ දී මා පිටුපස සෙවනැල්ල වූ ආදරණීය පියාණන් සහ මෑණියන් සිහිපත් කරන්නේ හදපිරි භක්ත්‍යාදරයෙනි.

**එන් ඒ අමරසිංහ**
"පියබිම"
කළහෙ
වංචාවල
ගාල්ල